# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසියතිල් කාදිරිය්යාහ් සංගමය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසියතිල් කාදිරිය්යාහ් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා විසින් 2017 ඔක්තෝබර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ඔක්තෝබර් මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[212 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 23.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010396—260 (2017/10)

# ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසියතිල් කාදිරිය්‍යාහ් සංගමය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසියතිල් කාදිරිය්‍යාහ් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

අතිඋතුම් කුතුබුස් සමාන් මාදිහුස් සිබ්තෙයින් අල්-අල්ලාමා අෂ්ශෙයික් ඉමාමුල් අරූස් සෙයියිද් මුහම්මද් මාපිල්ලෙයි ලෙබ්බයි ආලිම් වලියුල්ලාතුමා ශ්‍රී ලංකාව තුළ මස්ජිද, තක්තියා, මද්රසා, පුණ්‍ය භාර, මුස්ලිම් සිද්ධස්ථාන, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන කිහිපයක්ම ස්ථාපනය කොට ඇති කොට හා පවත්වාගෙන ඇති හෙයින් ද:

අතිඋතුම් කුතුබුස් සමාන් මාදිහුස් සිබ්තෙයින් අල්-අල්ලාමා අෂ්ශෙයික් ඉමාමුල් අරූස් සෙයියිද් මුහම්මද් මාපිල්ලෙයි ලෙබ්බයි ආලිම් වලියුල්ලා තුමාණෝ තරීකතුල් අරූසියතිල් කාදිරිය්‍යාහ් සංගමය ලෙස හැඳින්වෙන සංගමයක් එකී ආධ්‍යාත්මික ප්‍රධානියා විසින් නියම කරන ලද හා සාමාජිකයින් විසින් පිළිගන්නා ලද පිළිවෙත්, චාරිත්‍ර වාරිත්‍ර හා රීතීන් අනුකූලව එහි අරමුණු ඉෂ්ට කිරීම සඳහා සහ එකී සංගමය හා සම්බන්ධ සියලු කාරණාවන් ක්‍රියාවේ යෙදවීම සඳහා සඵලදායි ලෙස ශ්‍රී ලංකාව තුළ හා එතෙර පිහිටුවා ඇති ඇති හෙයින් ද:

එම සංගමය එය ස්ථාපනය කර ඇති විවිධ අරමුණු හා කාරණා සාර්ථකව ඉටු කොට හා ක්‍රියාවේ යොදවා ඇති අතර, එය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලා ඇති හෙයින් සහ එම ඉල්ලීම ඉටු කිරීම මගින් පොදු ජනතාවට යහපත සැලසෙන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක        දරන ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසියතිල් කාදිරිය්‍යාහ් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2—PL 005432—300 (2017/09)

ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසීයතිල් කාදිරිය්යාහ් සංගමය සංස්ථාගත කිරීම.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් හඳුන්වනු ලබන) ''ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසීයතිල් කාදිරිය්යාහ් සංගමය'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත හා එනමින් නඩු පැවරීමට හා පවරනු ලැබීමටත්, පොදු මුද්‍රාවක් භාවිතා කිරීමට හා රිසි විට හා රිසි පරිදි එය වෙනස් කිරීමටත් හැකි සංස්ථාපිත ආයතනයක් සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''සංගමය'' යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකාවේ තරීකතුල් අරූසීයතිල් සාදිරිය්යාහ් සංගමයේ සාමාජිකයෝ සංස්ථාවේ සාමාජිකයින් වශයෙන් ඉදිරියට ද කටයුතු කළ යුතු ය.

(3) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව මෙම පනතේ පළමුවන උපලේඛනය තුළ දක්වා ඇති ආයතනයන් ද ඇතුළුව සංගමයට පැවරී ඇති ආයතන ලැයිස්තුව මින් මතු සංස්ථාව වෙත පවරනු ලැබිය යුතු ය.

(4) ආධ්‍යාත්මික ප්‍රධානිවරයාට හෝ සංගමයට පැවරී ඇති, අයත් වන, කැප කෙරුණු හෝ සම්බන්ධ වූ කවර හෝ දේපළ, අයිතිවාසිකම් හෝ දෑ මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව සංස්ථාව වෙත පවරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාවේ පොදු පරමාර්ථ ලෙස ප්‍රකාශයට පත් කෙරෙනුයේ—

(අ) අතිඋතුම් කුතුබුස් සමාන් මාදිහුස් සිබ්තෙයින් අල්-අල්ලාමා අෂ්ශෙයික් ඉමාමුල් අරූස් සෙයියිද් මුහම්මද් මාපිල්ලෙයි ලෙබ්බයි ආලීම් වලියුල්ලා තුමාණන් සහ උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයින් විසින් පිහිටුවන ලද සංගමයට පැවරී ඇති, අයත් වන, කැප කෙරුණු හෝ සම්බන්ධ වූ සියලුම මස්ජිද,

තක්කියා මද්රසා, පුණ්‍ය භාර, මුස්ලිම් සිද්ධස්ථාන, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම;

(ආ) මෙම පනතේ පළමුවන උපලේඛනය තුළ දක්වා ඇති ආයතනයන්හි භාරකරුවන් පත්කිරීම, ඉවත් කිරීම හා පාලනය කිරීම;

(ඇ) සංස්ථාවට අයත්, සන්තක, කැපවුණු, සම්බන්ධ හෝ අනුබද්ධ විය හැකි සියලුම මස්ජිද, තක්කියා, මද්රසා පුණ්‍ය භාර, මුස්ලිම් සිද්ධස්ථාන, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන වෙත පත් කරනු ලබන භාරකරුවන් පත්කිරීම, ඉවත් කිරීම හා පාලනය කිරීම ද ඇතුළුව එකී මස්ජිද, තක්කියා, මද්රසා, පුණ්‍ය භාර, මුස්ලිම් සිද්ධස්ථාන, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම;

(ඈ) සංගමයේ ආධ්‍යාත්මික ප්‍රධානිවරයාට හෝ සංගමයට පැවරී ඇති, අයත් වන, කැප කෙරුණු හෝ සම්බන්ධ වූ කවර හෝ දේපළ හෝ නඩුකර අයිතිවාසිකම් අත්කර ගැනීම සඳහා නඩු පැවරීම;

(ඉ) සංගමයේ කවර හෝ අරමුණු ප්‍රගමණය කිරීම උදෙසා කවර හෝ නීති කෘත්‍යයන් ඇරඹීම;

(ඊ) සංගමයේ ආගමික හා ආධ්‍යාත්මික වතාවත් සිදු කිරීම;

(උ) ඉස්ලාමීය ලබ්ධියේ අනුගාමිකයින් අතර සුන්නත් වල් ජමාත් ඉස්ලාමික ජීවන මාර්ගය එනම් පුරෝගාමී ෂෙයික්වරයාගේ මස්හාබ් දිශාභිමුඛ තරීකතුල් අරූසියතිල් කාදිරිය්‍යාහ් සුෆිමාර්ගික උපදේශය ප්‍රවර්ධනය කිරීම;

(ඍ) ප්‍රජාවේ යහපත උදෙසා මස්හාබ් දිශාභිමුඛ න්‍යායන්, ඉස්ලාම් දහමේ ඉගැන්වීම්, ඉස්ලාම් සංස්කෘතිය හා සූෆි මාර්ගය ප්‍රචලිත කිරීම හා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(එ) පුරෝගාමී ශේක්වරයාගේ කෘති හා ජීවිතය පිළිබඳව පර්යේෂණ සිදු කිරීම;

(ඒ) මස්ජිද, තක්කියා, මද්රසා, පුණ්‍ය භාර, මුස්ලිම් සිද්ධස්ථාන, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන ඉදිකිරීම හා කළමනාකරණය කිරීම;

(ඔ) මස්ජිද, තක්කියා, මද්රසා, පුණ්‍ය භාර, මුස්ලිම් සිද්ධස්ථාන, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන ගොඩනැගීම, අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා අරමුදල් රැස්කිරීම සහ පුනඃස්ථාපන හා ද්‍රව්‍ය පිළිගැනීම සහ ආගමික හා ආධ්‍යාත්මික වතාවත් සිදු කිරීම;

(ඕ) දිළිඳුකම තුරන් කිරීම;

(ක) අධ්‍යාපනය ප්‍රගමණය කිරීම;

(ග) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම;

(ජ) සංස්ථාවේ සියලුම හෝ කවර හෝ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය, උපයෝගී හෝ ආනුෂංගික වන්නා වූ අන් සියලු ක්‍රියා හා කරුණු කාරණා සිදු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. (1) සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් කවර එකක් වුව ද ප්‍රවර්ධනය හා ප්‍රගමනය සඳහා අවශ්‍ය හා අභිමත වන පොළී නොලබන බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මකව පවත්වා ගෙන යාමට හෝ වසා දැමීමට, ඇප ඇතිව හෝ නැතිව පොළී රහිත මුදල්

ණයට ගැනීමට හෝ මුදල් රැස්කිරීමට, ප්‍රදානයන් හා පරිත්‍යාග ලබා ගැනීමට, එකතු කිරීමට හා යෙදවීමට, සංස්ථාව වෙත පවරනු ලබන හෝ සංස්ථාව විසින් අත්කර ගනු ලබන හෝ දරනු ලබන ඉඩම් මත කවර හෝ ගොඩනැගිලි ඉදිකරනු පිණිස එහි අරමුදල් ආයෝජනය කිරීමට, ඉඩම් අත්කර ගැනීමට, මිළදී ගැනීමට, බද්දට ගැනීමට හා කුලියට ගැනීමට, චංචල දේපළ හා නඩුකර අයිතිවාසිකම් තුළ ආයෝජනය කිරීමට සහ සංස්ථාවේ සියලුම හෝ කවර හෝ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා පිරිස් යෙදවීමට, සේවා නියුක්ත කිරීමට හා සේවයෙන් පහකිරීමට බලයද ඇතුළුව සියලු ක්‍රියා හා කරුණු කාරණා සහ කවර හෝ දෑ සිදු කිරීම, ඉටු කිරීම හා ක්‍රියාවේ යෙදවීම පිණිස සංස්ථාවට බලය තිබිය යුතු ය:

කෙසේ වුව ද, සියලුම අවස්ථාවන්හිදී ම සංස්ථාවේ බලතල සුන්නත් වල් ජමාත් මූලධර්මවලට අනුකූලව ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි ආධ්‍යාත්මික ප්‍රධානිවරයා, සංගමය හෝ සංස්ථාව හට අයත් වන, කැප කෙරුණු හෝ සම්බන්ධ වූ බවට හෝ ඔවුන් සඳහා හෝ වෙනුවෙන් හෝ වෙනුවෙන් කළමණාකරණය කරනු බවට හිමිකම් පානු ලබන කවර හෝ දේපළක් සම්බන්ධයෙන් නඩු පැවරීමට ද සංස්ථාවට බලය තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) ආධ්‍යාත්මික ප්‍රධානියාගේ පොදු පාලනයට හා විධානයට යටත්ව, ඔහු විසින් පත් කරනු ලැබිය හැකි නිලධරයන් සංඛ්‍යාවකගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ කළමනාකරණය හා පරිපාලනය සිදු කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ආධ්‍යාත්මික ප්‍රධානිවරයා එම තනතුර හොබවන තාක් එහි යාවජීව අනුශාසකවරයා විය යුතු ය.

(3) මෙම පනත බලාත්මක වීමක් සමගම, සංගමයේ වර්තමාන ශේක් නිලය දරන අතිඋතුම් අෂ්ෂෙයික් අෆ්දලුල් උලමා ආචාර්ය

තයිකා ශු' අයිබ් ආලිම් බී.ඒ.(ගෞරව)., එම්.ඒ.,පී.එච්.ඩී.,එෆ්.එ,ජලාලි, තුමා සංස්ථාවේ ආධ්‍යාත්මික ප්‍රධානිවරයා විය යුතු අතර ජීවත්ව සිටින තාක් එම නිලය දැරිය යුතු ය.

(4) ආධ්‍යාත්මික ප්‍රධානිවරයාට සිය අභිමතය පරිදි සිය අනුප්‍රාප්තිකයා නම් කිරීමට බලය හා අධිකාරි බලය තිබිය යුතු ය. එම නම් කිරීම රීතිවලට අනුකූලව විය යුතු අතර නිලයේ සිටින ආධ්‍යාත්මික ප්‍රධානිවරයාගේ අභාවය හෝ අශක්නුතාවය ඇති වූ විට ක්‍රියාත්මක විය යුතු ය. ආධ්‍යාත්මික ප්‍රධානිවරයාට සිය පරම අභිමතය පරිදි සුදුසු යැයි තමා සිතන තැනැත්තන් හට තමන් විසින් නියම කරනු ලබන කාලයක් සඳහා සිය බලතල හෝ කාර්යයන් අතරින් කවර හෝ ඒවා පවරා දිය හැකි ය. එබඳු කවර හෝ ඒවා පවරා දී තිබුණ ද, ආධ්‍යාත්මික ප්‍රධානිවරයාට කවර අවස්ථාවක දී වුව ද, එම බලතල හෝ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම හෝ එසේ පවරා දෙනු ලැබ ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට දැනුම් දීමකින් තොරව, එම පැවරීම අවලංගු කිරීම කළ හැකි ය.

(5) ආධ්‍යාත්මික ප්‍රධානිවරයාගේ අනුප්‍රාප්තිකයෝ අවරෝහණ අනුපිළිවෙළින් පහත සඳහන් පරිදි විය යුතු ය:—

(i) අති උතුම් අෂ්ෂෙයි අෆ්දලුල් උලමා අහ්මඩ් නාසිර් තයිකා ශු' අයිබ් නොහොත් තියාකා නසිර් ආලිම් ජලාලි., බී.ඒ. (ඉතිහාසය) එම්.එෆ්.ඒ.,ෆායිල් ජමාලි, විය යුතු ය. ඉන් ඉක්බිතිව විය යුත්තේ;

(ii) අති උතුම් අෂ්ෂෙයික් යාසීන් මුජිරුද්දීන් නොහොත් තයිකා මුජිරුද්දීන් ආලීම් ජලාලි., බී.ඒ. (ව්‍යාපාරික අධ්‍යයනය) එක්සත් රාජධානිය, අල් අස්හාරි විය යුතු ය. ඉන් ඉක්බිතිව;

(iii) අති උතුම් අෂ්ෂෙයික් යාසීන් මුජිරුද්දීන් නොහොත් තයිකා මුජිරුද්දීන් ආලීම් ජලාලි, බී.ඒ. (ව්‍යාපාරික අධ්‍යයනය) එක්සත් රාජධානිය, අල් අස්හාරි විසින් නම් කරනු ලබන තැනැත්තකු විය යුතු ය.

(6) ආධ්‍යාත්මික ප්‍රධානිවරයා සංස්ථාවේ භාරකාර මණ්ඩලය සහ මෙම පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති එක් එක් ආයතනයට භාරකාර මණ්ඩලයක් බැගින් පත් කිරීම නීත්‍යනුකූල විය යුතු අතර එම තැනැත්තන් ආධ්‍යාත්මික ප්‍රධානිවරයා තිසි තාක් සිය ධුරයන් දැරිය යුතු ය:

එසේ වුවද, සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය සහ මෙම පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති එක් එක් ආයතනයේ ප්‍රථම භාරකාර මණ්ඩලය ආධ්‍යාත්මික ප්‍රධානිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම තැනැත්තන් ආධ්‍යාත්මික ප්‍රධානිවරයා රිසි තාක් කල් නිලතල දැරිය යුතු ය.

(7) මස්ජිද, තක්කියා, මද්‍රසා, පුන්‍ය භාර, ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතනයන්හි අදාළ පරිදි භාරකාර මණ්ඩලවලට හෝ කළමනාකරණ මණ්ඩලවලට මෙම සංස්ථාවට අනුබද්ධ වීම සඳහා ඉල්ලුම් කළ හැකිය. ආධ්‍යාත්මික ප්‍රධානිවරයාට සිය පරම අභිමතය පරිදි එම ඉල්ලීමට අවසර දිය හැකිය. එබඳු ඉල්ලීමකට අවසර දුන් අවස්ථාවක, අදාළ මස්ජිදය, තක්කියාව, මද්‍රසාව, පුණ්‍ය භාරය, ආගමික සිද්ධස්ථානය හෝ වෙනත් ආයතනය සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධානයන් ආදාළ විය යුතු ය.

**6.** (1) මෙම පනතේ මූලධර්ම හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිස රීති සෑදීමට ඇති බලතලවලට පොදුවේ අගතියක් නොවන පරිදි ආධ්‍යාත්මික ප්‍රධානිවරයා විසින් පහත කාර්යයන් සඳහා රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය සඳහා සුදුසුකම්, ඇතුළත් කර ගැනීමේ, ඉවත්කර ගැනීමේ, නෙරපීමේ හා ඉල්ලා අස්වීමේ ක්‍රමය සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු නිර්ණය කිරීම ;

(ආ) භාරකාර මණ්ඩල සාමාජිකයන්ගේ පත්කිරීම, ඉල්ලා අස්වීම හෝ සේවයේ හැර යාම හෝ ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, රාජකාරි හා ක්‍රියාකලාපය ;

(ඇ) විවිධ නිලධාරීන්, නියෝජිතයන් හා සේවකයින් පත් කිරීම, බලතල, රාජකාරි හා කාර්යයන්, හැසිරීම් හා විනය පාලනය;

(ඈ) භාරකාර මණ්ඩලවල රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්මේදී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල දැනුම් දීම, න්‍යාය පත්‍රය, ගණපූරණය හා කාර්යයන් මෙහෙයවීම පිළිබඳ සියලුම කාරණා ;

(ඉ) දේපළ පරිපාලනය හා කළමනාකරණය ;

(ඊ) පොදුවේ ආගමික, ආධ්‍යාත්මික හා ලෞකික කටයුතු කළමනාකරණය කිරීම හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය යයි ආධ්‍යාත්මික ප්‍රධානියා අදහස් කරන අන් කාරණා.

(2) කවර රීතියක් වුව ද, මෙම වගන්තියේ (1) උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ආකාරයෙන් සංශෝධනය, විචලනය, වෙනස් හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) දෙවන උපලේඛනයේ ඇති සංගමයේ රීති මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ පටන් ඉදිරියට ක්‍රියාත්මකව තිබිය යුතු අතර, ඒවා සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) කලින් කලට සාදනු ලබන රීතීන්ට සහ මෙම පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති රීතීන්ට සංස්ථාවේ සාමාජිකයින් යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට ස්වකීය අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව වෙනුවෙන් සහ එහි ගිණුමට ත්‍යාග. රික්තවරණ, පුණ්‍යස්ථාපන, පරිත්‍යාග, දායක මුදල්, සම්මාදම්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර හෝ මින්මතු ලැබෙන සියලු මුදල් භාරකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු පරිදි එක් බැංකුවක හෝ බැංකු එකකට වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවෙහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන කවර හෝ වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**8.** (1) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පැවති සංගමයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමය වෙත අයවිය යුතු සියලු ණය හා සංගමය වෙත ගෙවිය යුතු සියලු දයක මුදල් හා සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්ම වන අවස්ථාව වන විට සංස්ථාවේ පැවති සියලු අයිතිවාසිකම් සහ බැරකම් මේ පනතේ කාර්යයන් සඳහා, අවශ්‍ය වෙනස් කිරීම් ද සහිතව, සංස්ථාවට පවරනු ලැබිය යුතු ය.

සංස්ථාවට චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත පැවරෙන්නා වූ යම් දේපලක් දැරීමේ හිමිකම සංස්ථාවට තිබිය යුතු අතර, මෙම පනතේ කාර්යයන් සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, එවැනි සියලු දේපළ විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාව විසින් දැරිය යුතු ය:

කෙසේ වුව ද, කවර හෝ දේපළක් පිළිබන්ධනය කිරීමට සංස්ථාවට ඇති බලය ෂාරියා මූලධර්මවලට අනුකූල වන පරිද්දෙන් ක්‍රියාවේ යෙදවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සංස්ථාවේ නිල මුද්‍රාව තැබීම ආධ්‍යාත්මික ප්‍රධානීවරයා විසින් හෝ ඔහු විසින් නිසි ලෙස ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.

විභාග කෙරෙමින් පවතින නඩු.

**11.** සංගමයට පවරන ලද, අයත්, කැප කෙරුණු හෝ සම්බන්ධ කවර හෝ ක්‍රියාමාර්ගයක්, නීති කෘත්‍යයක් හෝ දෙයක් මෙම පනත ආරම්භ වන දිනයේ සිට හා එදිනට පසුව සංස්ථාව නමින් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතෙහි අඩංගු කිසිවකින් හෝ ජනරජයේ අයිතිවාසිකම්වලට අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පළමුවන උපලේඛනය [2(3) වගන්තිය]

ආයතන ලැයිස්තුව

1. මග්නමුස් සුආදා තයිකා,
අංක 159, පරණ යොන් වීදිය, කොළඹ 12.

2. අල්- මස්ජිදුල් බුහාරි තයිකා,
අංක 25, ඉමාමුල් අරූස් මාවත, මරදාන, කොළඹ 10.

3. අරූසියතිල් කාදිරිය්යාහ් මද්රසා අරාබි විද්‍යාලය
අංක 108/31, මාලිගාකන්ද පාර, කෙළඹ 10.

4. කටකල මරනඩි තයිකා සහ දේවස්ථානය,
අංක 32, ක්ලිෆ්ටන් පටුමග දෙමටගොඩ, කොළඹ 09.

5. හුසෙයින් වලියුල්ලා තයිකා නොහොත් අස්-ශෙයිකු
අස්සෙයියිදු මුහම්මදු හුසෙයින් වලියුල්ලා තයිකා,
අංක 677, කොළඹ-ගාල්ල පාර, ගිංතොට.

6. කල්වත් තක්කියා,
ගොඩවත්ත, වක්වැල්ල පාර, ගිංතොට.

7. මස්ජිද් මුහ්යිද්දීන් තක්කියා,
අංක 37, එච්.කේ.එඩ්මන්ඩ් මාවත, මිලිදූව, ගාල්ල.

8. මග්නම් අබ්කල් හම්දු තක්කියා,
මාතර පාර කටුගොඩ, ගාල්ල.

9. මස්ජිදුල් අරූසියා තක්කියා,
අකුරුස්ස පාර, නුගදූව, ගාල්ල.

10. බුහාරි මස්ජිදය සහ මද්රසා
බුහාරි මස්ජිද් පාර, ගල්බොක්ක, වැලිගම.

11. ම' ආලුල් කයිරාත් තක්කියා,
අංක 4, ශාන්ත සර්වේශියස් පාර, කොටුවේගොඩ, මාතර.

12. මල්හරූස් සලාහ් තයිකා,
අංක 49 (පරණ අංක 917), යෙහියා මාවත, මාතර.

13. මුහ්යිද්දීන් අරූසියා කාදිරියා තයිකා,
අංක 40, වෝකර් මාවත, හම්බන්තොට.

14. අරූස් මවුලානා මක්බරාහ් දේවස්ථානය,
ආන්ඩියකඩවත්ත, ගම්පොල.

15. මාපිල්ලෙයි ආලිම් කල්වත් ජල්වත් තයිකා,
වාට්ටු අංක 1, තක්වා නගර්, පුල්මොඩෙයි.

දෙවන උපලේඛනය [6(4) වගන්තිය]

සංස්ථාවේ නීති රීති හා රෙගුලාසි

1. සුන්නත් වල් ජමාත් ඉස්ලාමීය දහම වැළඳ ගන්නා සියලු තැනැත්තන් හට මෙම සංස්ථාවේ සාමාජිකත්වය විවෘත ය.

2. අන්‍යාකාරයකින් සංශෝධනය කෙරෙන්නේ නම් හැර සංගමය සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා සම්බන්ධ රීති ද ඇතුළු මෙතෙක් බලපැවැත්වූ රීති සංස්ථාවට අදාළ විය යුතු ය:—

(අ) ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් සිදු කිරීම;

(ආ) ආධ්‍යාත්මික හා ආගමික සේවාවන් ලබා දිය යුත්තේ කවරකු ද යන්න;

(ඇ) භාරකරුවන් සංඛ්‍යාව හා ඔවුන්ගේ පත්කිරීම, ඉවත් කිරීම, විනය පාලනය හා සේවයෙන් ඉවත් කිරීම;

(ඈ) සාමාජිකයින් සංඛ්‍යාව හා ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, විනය පාලනය හා නෙරපා දැමීම;

(ඉ) ආධ්‍යාත්මික ප්‍රධානිවරයාගේ අනුප්‍රාප්තිය; සහ

(ඊ) සංස්ථාවේ මූලික සිද්ධාන්ත ආශ්‍රිත රීති.

3. සංස්ථාවේ මූලික සිද්ධාන්ත ආශ්‍රිත රීති හැර මෙම රීති කලින් කලට විචලනය කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකිය.